**1990 අංක 13 දරණ බදු හා ගාස්තු පැනවීම සහ අයකිරීම පිළිබඳ ප්‍රඥප්තිය සංශෝධනය කිරීම සඳහා වූ 1991 අංක 7 දරණ මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය**

**1990 අංක 13 දරණ උතුරු මැද පළාතේ බදු හා ගාස්තු පැනවීම සහ අයකිරීම සඳහාද, ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහාද විධිවිධාන සැලැස්වීම පිණිසවූ පඥප්තියට සංශෝධනයකි.**

# Imposition of Rates and Taxes Statute No. 07 of 1991

1990 අංක දරණ උතුරු මැද පළාතේ මුදල් ප්‍රඥප්තිය සංශෝධනය කිරීම සඳහා වූ කෙටුම්පත ප්‍රඥප්තිය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ උතුරු මැද පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ.

1. මේ ප්‍රඥප්තිය 1991 අංක 7 දරණ උතුරු මැද පළාතේ මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය

2. (මෙහි මින් මතු 'ප්‍රධාන ප්‍රඥ්පතිය' යනුවෙන් හඳුන්වනු ලබන) 1990 අංක 13 දරණ උතුරු මැද පළාතේ මුදල් ප්‍රඥප්තියේ 10 වන වගන්තියේ පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ. — 1990 අංක 13 දරණ මුදල් ප්‍රඥප්තියේ 10 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) ඒ වගන්තියේ (5) වන උප වගන්තියේ 'කොමසාරිස් ජනරාල්' යන වචන වෙනුවට 'කොමසාරිස්' යන වචනය ආදේශ කිරීමෙන් සහ

(2) ඒ වගන්තියේ (10) වන උප වගන්තියේ 'තිස් පහ වගන්තිය' යන වචනය වෙනුවට '34 වගන්තිය' යන ඉලක්කම් හා වචනය ආදේශ කිරීමෙන්.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තියේ අගට පහත දැක්වෙන අතුරු විධානය එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. — ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය සංශෝධනය කිරීම

'එසේ වුවද, යම් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් යම් කාර්තුවක් සඳහා ගෙවිය යුතු පිරිවැටුම් බද්ද, (මින් මතු මෙම අතුරු විධානයේ 'පෙර කාර්තුව' යනුවෙන් හඳුන්වනු ලබන) එම ව්‍යාපාරයේ එම කාර්තුවට ආසන්නවම වූ පෙර කාර්තුව සඳහා පිරිවැටුම රුපියල් දශ ලක්ෂ පහක් ඉක්මවයි නම් පහත දැක්වෙන ආකාරයට ගෙවනු ලැබිය යුතුය,

(අ) පෙර කාර්තුව සඳහ ගෙවිය යුත පිරිවැටුම් බද්දෙන් තුනෙන් එකකට සමාන මුදලක් කාර්තුවේ දෙවන මාසයේ පහළොස් වන දිනට හෝ ඊට පෙර ගෙවිය යුතුය.

(ආ) පෙර කාර්තුව සඳහා ගෙවිය යුතු පිරිවැටුම් බද්දෙන් තුනෙන් එකකට සමාන මුදලක් කාර්තුවේ තුන්වන මාසයේ පහළොස් වන දිනදී හෝ ඊට පෙර ගෙවිය යුතුය.

(ඇ) කාර්තුව සඳහා ගෙවිය යුතු ඉතිරි පිරිවැටුම් බද්ද කාර්තුව අවසාන වී ඉක්බිතිව එළඹෙන මාසයේ පහළොස් වන දිනදී හෝ ඊට පෙර ගෙවිය යුතුය.

'එසේ නොගෙවන ලද යම් බද්දක් ගෙවීම පැහැර හරින ලද බද්දක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ බද්ද ගෙවනු ලැබිය යුත්තේ යම් තැනැත්තකු විසින්ද, ඒ තැනැත්තා හෝ ඒ බද්ද එක් තැනැත්තෙකුට වැඩි දෙනෙකු විසින් හෝ හවුල් ව්‍යාපාරයක් විසින් හෝ ගෙවිය යුතුව ඇති අවස්ථාවක ඒ තැනැත්තන්ගෙන් එක් එක් තැනැත්තා සහ හවුල් ව්‍යාපාරයේ එක් එක් හවුල්කරු මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා ගෙවීම පැහැර හරින්නෙකුසේ සැලකිය යුතුය'

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තිය පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) ඒ වගන්තියේ (අ) ඡේදයේ 'විකිණීමට' යන වචනය වෙනුවට 'පැවරීමකට' යන වචනය ආදේශ කිරීමෙන් සහ

(2) ඒ වගන්තියේ (ඇ) ඡේදයේ 'අයිතිය පිළිබඳව කරනු ලබන සෑම පැවරීමක්' යන වචනය වෙනුවට 'අයිතිය පැවරීමේ සෑම සාධන පත්‍රයක්'

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වගන්තියයේ (5) වන ඡේදයේ (ඊ) අනුඡේදය වෙනුවට පහත දැක්වෙන අනුඡේදය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වන වගන්තිය සංශෝධනය කිරීම

'(ඊ) 1978 අංක 27 දරණ නීති ආධාර නීතිය යටතේ අනුමත කරන ලද නීති ආධාර යෝජනා ක්‍රමයේ පාලකවරයා විසින් හෝ ඔහු විසින් එම කාර්ය සඳහා යථා පරිදි බලය පවරනු ලැබූ යම් නිලධාරියකු විසින් සහතික කරනු ලැබූ ඕනෑම තැනැත්තකු විසින් එකී නීති ආධාර නීතිය යටතේ සපයනු ලබන නීති ආධාර මත කරනු ලබන නඩු පැවරීමකදී, විත්ති වාචක ඉදිරිපත් කිරීමකදී හෝ මැදිහත් වීමකදී ඔහු විසින් හෝ ඔහු වෙනුවෙන් ඉදිරිපත් කරනු ලබන සියලු ලේඛන'

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වන වගන්තියේ (2) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 40 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) 'විකිණීමකට' යන වචනය වෙනුවට 'පැවරීමකට' යන වචනය ආදේශ කිරීමෙන් සහ

(2) 'එහෙත් එවැනි සෑම අවස්ථාවකදීම, ඒ සාධන පත්‍රය සහතික කරන නොතාරිස්වරයා විසින් ඒ හේතු සාධන පත්‍රයෙහි සහතික කළ යුතුය' යන වචන ඉවත් කිරීමෙන්.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තියේ (3) වන උපවගන්තියේ 'දක්වා ඇති ආකාරයට අවලංගු කොට නොමැති' යන වචනය වෙනුවට, 'දක්වා ඇති ආකාරයට අවලංගු කොට නොමැති' යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තිය සංශෝධනය කිරීම

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ 43 අ වන වගන්තිය ලෙස බලපැවැත්විය යුතුය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 43 අ වන අලුත් වගන්තිය ඇතුළත් කිරීම

'43 අ. යම් සාධන පත්‍රයක්'

(අ) පළාතේ සීමා තුළ එක් කොටසක්ද වෙන පළාත් එකක හෝ ඊට වැඩි ගණනක සීමා තුළ අනෙක් කොටසද පිහිටා ඇති යම් නිශ්චල දේපළක් පැවරීමකට අදාළ සාධන පත්‍රයක් වන අවස්ථාවකදී මේ ප්‍රඥප්තිය යටතේ ඒ සාධන පත්‍රය සඳහා අය කළ යුතු මුද්දර ගාස්තුව මේ ප්‍රඥප්තියේ විධිවිධාන සලස්වා ඇති ආකාරයට ගෙවා තිබේ නම් හෝ, ඒ දේපළෙහි අනෙක් කොටස පිහිටා ඇත්තේ යම් වෙනත් පළාතක හෝ පළාත්වල සීමා තුළද, අවස්ථාවෝචිත පරිදි, ඒ වෙනත් පළාතේ හෝ පළාත්වල මුදල් ප්‍රඥප්තිය යටතේ අය කළ යුතු මුද්දර ගාස්තුව ඒ ප්‍රඥප්තියේ විධිවිධාන සලස්වා ඇති ආකාරයට ගෙවා තිබේ නම්, ඒ දේපළ සම්බන්ධයෙන් ඒ සාධන පත්‍රය යථා පරිදි මුද්දර ගැසූ සාධන පත්‍රයක් ලෙස

'එක් පළාතකට වඩා වැඩි පළාත් ගණනක පිහිටි දේපළ සම්බන්ධයෙන් මුද්දර ගාස්තු

සලකනු ලැබිය යුතුය.

නැතහොත්

(ආ) එක් නිශ්චල දේපළක් හෝ එකකට වැඩි නිශ්චල දේපළ සංඛ්‍යාවක් පළාතේ සීමා තුළ පිහිටා ඇත්තාවූද අනෙක් දේපළ එකක් හෝ වැඩි ගණනක් වෙනත් පළාත් එකක හෝ ඊට වැඩි ගණනක සීමා තුළ පිහිටි ඇත්තාවූද විටක ඒ දේපළ පැවරීමකට අදාළ සාධන පත්‍රයක් වන අවස්ථාවකදී මේ ප්‍රඥප්තිය යටතේ අය කරනු ලැබිය යුතු මුද්දර ගාස්තුවට සමාන මුද්දර මේ ප්‍රඥප්තියෙන් විධිවිධාන සලස්වා ඇති ආකාරයට ගෙවා ඇත්තේ නම් හෝ ඒ අනෙක් දේපළ පිහිටියේ යම් පළාතක හෝ පළාත්වල සීමා තුළද, ඒ අනෙක් පළාතේ හෝ පළාත්වල මුදල් ප්‍රඥප්තිය යටතේ අය කළ යුතු මුද්දර ගාස්තුව ඒ ප්‍රඥප්තියේ විධිවිධාන සලස්වා ඇති ආකාරයට ඒ සාධන පත්‍රයෙහි අලවා ඇත්තේ නම් ඒ දේපළ සම්බන්ධයෙන් ඒ සාධන පත්‍රය යථා පරිදි මුද්දර ගැසූ සාධන පත්‍රයක් ලෙස සලකනු ලැබිය යුතුය.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තියේ 'රුපියල් එකක මුද්දරයක් දැරිය යුතුය' යන වචනය වෙනුවට, 'රුපියල් එකක මුද්දර ගැසීම හෝ එකී රුපියලක මුද්දර ගාස්තුව 40 වන වගන්තියේ (2) වන උප වගන්තියේ දක්වා ඇති ආකාරයට නියමිත බැංකුවකට ගෙවනු ලැබිය යුතුය' යන කොටස ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තිය සංශෝධනය කිරීම

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ

'අධිකරණයකට ඉදිරිපත් කරන ලද හෝ ගොනු කරන ලද හෝ පවරන ලද ලේඛන සඳහා ගෙවිය යුතු මුද්දර ගාස්තුවද පහත දැක්වෙන කොන්දේසි මත' යන වචනය වෙනුවට අධිකරණයක පවරන ලද යම් නීති කෘත්‍යයකදී ඉදිරිපත් කරන ලද හෝ ගොනු කරන ලද ලේඛන සඳහා ගෙවිය යුතු මුද්දර ගාස්තුව පහත දැක්වෙන කොන්දේසිවලට යටත්ව' යන වචන ආදේශ කිරීමෙන් සහ

(2) ඒ වගන්තියේ (2) වන උප වගන්තියේ 'ඒ ලේඛනයෙහි පිටසන් කළ යුතුය' යන වචනය වෙනුවට 'ඒ ලේඛනබෙහි පිටසන් කළ යුතු අතර, ඉන්පසු ඒ ලේඛනය යථා පරිදි මුද්දර ගැසූ ලේඛනයක් ලෙස සලකනු ලැබිය යුතුය' යන වචන ආදේශ කිරීමෙන් සහ

(3) ඒ වගන්තියේ (2) වන උප වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන උප වගන්තිය ඇතුළත් කිරීමෙන්,

''(3) යම් සාධන පත්‍රයක් හෝ ලේඛනයක් සඳහා අය කළ යුතු මුද්දර ගාස්තුව ඉහත සඳහන් පරිදි සමතයකට පමුණුවා තිබුණේ වුවද, ඒ නොතකා සාධන පත්‍රය හෝ ලේඛන සම්බන්ධයෙන් ගෙවිය යුතු නිසි මුද්දර ගාස්තු කොමසාරිස්වරයා විසින් නිශ්චය කරනු ලැබිය හකිය.

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තියේ (1) වන උප වගන්තියේ, 'මේ ප්‍රඥප්තියෙන් හෝ වෙනත් යම් ප්‍රඥප්තියකින් අන්‍යාකාර විධිවිධාන සලසා තිබේ නම්' යන වචනය වෙනුවට, 'මේ ප්‍රඥප්තියෙන් හෝ වෙනත් යම් ප්‍රඥප්තියකින් අන්‍යාකාර විධිවිධාන සලසා තිබේ නම්' යන වචනය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින්

ප්‍රධාන ප්‍රඥප්තියේ 47 වන වගන්තිය සංශෝධනය කිරීම

සංශෝධනය කරනු ලැබේ.

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ආදේශ කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 51 වන වගන්තිය සංශෝධනය කිරීම

51. මීට පටහැනිව යම් ගිවිසුමක් තිබුණාහොත් මිස පහත දැක්වෙන තැනැත්තන් විසින් මුද්දර ගාස්තුව ගෙවිය යුතුය. ගාස්තුව ගෙවිය යුත්තේ කවුරුන් විසින්ද යන වග

(අ) පැවරීමේ සාධන පත්‍රයක් සම්බන්ධයෙන් වන විට ලැබුම්කරු විසින් සහ

(ආ) වෙනත් යම් සාධන පත්‍රයක් සම්බන්ධයෙන් වන විට, ඒ සාධන පත්‍රය පිළියෙළ කරන ලියන හෝ ලියා අත්සන් කරන තනැත්තා විසින්,

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තියේ (4) වන උප වගන්තියේ, 'ජීවත්ව සිටියේ නම්, ඔහුගෙන් මුද්දර ගාස්තු අයකර ගැනීමට යටත් වන සියලු ක්‍රියා' යන වචනය වෙනුවට, 'ජීවත්ව සිටියේ නම්, මේ ප්‍රඥප්තිය යටතේ කිරීමට ඔහු යටත්ව සිටියා වූ සියලු ක්‍රියා' යන වචනය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තිය සංශෝධනය කිරීම

14. ප්‍රධාන ප්‍රඥප්තියේ 63 වන වගන්තියේ, මේ පනත යටතේ ඔහු යටත්ව ඇති යම් දන්ඩනයකින් ඔහු මුදා හරිනු ලැබිය යුතුය' යන වචනය වෙනුවට 'මේ ප්‍රඥප්තිය යටතේ ඔහු යටත් විය යුතු යම් දණ්ඩනයකින් ඔහු මුදා හරිනු ලැබිය යුතුය' යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ. ප්‍රධාන ප්‍රඥප්තියේ 63 වන වගන්තිය සංශෝධනය කිරීම

15. ප්‍රධාන ප්‍රඥප්තියේ 64 වන වගන්තියේ (2) වන උප වගන්තියේ 'එහි මුලින් නිසි මුද්දර ගැසූ විටෙක මෙන්' යන වචනය වෙනුවට 'එහි මුලින් නිසි පරිදි මුද්දර ගැසූ විටෙක මෙන්' යන වචනය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 64 වන වගන්තිය සංශෝධනය කිරීම

16. ප්‍රධාන ප්‍රඥප්තියේ 65 වන වගන්තියේ (3) උප වගන්තියට ඉක්බිතිව පහත දැක්වෙන අලුත් උප වගන්තිය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 65 වන වගන්තිය සංශෝධනය කිරීම

''(4) මේ වගන්තියේ කාර්ය සඳහා 'මුද්දර' යන යෙදුමට, අලවන මුද්දරයක් හෝ ලාංජිත මුද්දරයක් හෝ 40 (2) වන වගන්තිය යටතේ යථා පරිදි නිකුත් කරනු ලැබූ මුද්දර ගාස්තු ගෙවූ බවට වූ සහතිකයක් ඇතුළත් වේ''

17. ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තියේ (2) වන උප වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් උප වගන්තිය ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තියෙහි අලුත් උපවගන්තියක් ඇතුළත් කිරීම

'(3) මේ වගන්තියේ කාර්ය සඳහා 'මුද්දරයක් යන යෙදුමට, යම් අලවන මුද්දරයක්, ලාංජිත මුද්දරයක් හෝ මුද්දර ගාස්තු ගෙවූ බවට 40 (2) වන වගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ සහතිකයක් ඇතුළත් වේ.'

18. ප්‍රධාන ප්‍රඥප්තියේ 68 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 68 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) එකී 68 වන වගන්තියේ ඒ වගන්තියේ 68 (1) වන

උප වගන්තිය ලෙස යළි අංක කිරීමෙන්, සහ

(2) එසේ යළි අංක කරන ලද උප වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් උප වගන්තිය ඇතුළත් කිරීමෙන් :-

'(2) (1) වන උප වගන්තියේ කාර්ය සඳහා 'මුද්දරයක්' යන යෙදුමට, යම් අලවන මුද්දරයක්, ලාංජිත මුද්දරයක් හෝ මුද්දර ගාස්තු ගෙවූ බවට 40 (2) වන වගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ සහතිකයක් ඇතුළත් වේ.

19. ප්‍රධාන ප්‍රඥප්තියේ 73 වගන්තියේ (7) වන උප වගන්තියේ දැක්වෙන, '5 වන උප වගන්තියේ' යන ඉලක්කම හා වචන වෙනුවට '6 වන උප වගන්තියේ' යන ඉලක්කම හා වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 73 වන වගන්තිය සංශෝධනය කිරීම

20. ප්‍රධාන ප්‍රඥප්තියේ 78 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 78 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) ඒ වගන්තියේ (4) වන උප වගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උප වගන්තිය ආදේශ කිරීමෙන්

''(4) යම් සාධන පත්‍රයක් මත ගෙවිය යුතු මුද්දර ගාස්තුව 40 වන වගන්තියේ (2) වන හෝ (3) වන උපවගන්තිවල දක්වා ඇති ආකාරයට ගෙවා ඇති අවස්ථාවකදී 40 වන වගන්තියේ (2) වන උප වගන්තිය යටතේ බැංකුව විසින් නිකුත් කරන ලද ගෙවීම් සහ සහතිකය ඒ සාධන පත්‍රයේ පිටපතට යථා පරිදි අලවා

ඇති බව හෝ 40 වන වගන්තියේ (3) වන උප වගන්තියේ දක්වා ඇති ආකාරයට ඒ සාධන පත්‍රය කොමසාරිස්වරයා විසින් පිටසන් කර ඇති බව ඒ සාධන පත්‍රය සහතික කරන මහජන නොතාරිස්වරයා විසින් තම සහතිකය මගින් සහතික කළ යුතුය.

(2) එකී (4) වන උප වගන්තියට ඉක්බිතිවම ඒ වගන්තියේ (5) වන උප වගන්තිය මෙන් බලපාන පරිදි පහත දැක්වෙන උප වගන්තිය එහි ඇතුළත් කිරීමෙන්

''(5) මේ ප්‍රඥප්තිය යටතේ මුද්දර ගාස්තු අය කරනු ලැබිය යුතු යම් සාධන පත්‍රයකට හෝ ලේඛනයට 1991 ජනවාරි 01 දින සිට 1991 සැප්තැම්බර් 30 දින දක්වා වූ කාලය තුළදී 1982 අංක 43 දරණ මුද්දර ගාස්තු පනතේ විධිවිධානවලට හෝ මේ ප්‍රඥප්තියේ විධිවිධානවලට අනුකූලව යථාපරිදි මුද්දර ගසා තිබේ නම් ඒ සාධන පත්‍රය හෝ ලේඛනය යථා පරිදි මුද්දර ගැසූ සාධන පත්‍රයක් හෝ ලේඛනයක් ලෙස සළකනු ලැබිය යුතුය.

21. ප්‍රධාන ප්‍රඥප්තියේ xxxi වන පරිච්ඡේදයේ ශීර්ෂපාඨයේ 'අධිකරණ දඩ' වචන වෙනුවට 'අධිකරණ දඩ සහ ගාස්තු' යන වචන ආදේශ කිරීමෙන් ඒ ශීර්ෂපාඨය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ xxxi පරිච්ඡේදනය සංශෝධනය කිරීම

22. ප්‍රධාන ප්‍රඥප්තියේ 99 වන වගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය මෙයින් ආදේශය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 99 වන වගන්තිය සංශෝධනය කිරීම

99. (1) පළාත තුළ අධිකරණ බලය ක්‍රියාත්මක කරන අධිකරණයක් ලෙසින් යම් ලිඛිත නීතියක් යටතේ පනවා ඇති බදු ගාස්තු හෝ වෙනත් පැනවීම් අයකර ගැනීම සඳහා පනවනු ලබන දඩ හැර, වැරදි සම්බන්ධයෙන් ඒ අධිකරණය විසින් පනවනු ලබන්නාවූ සහ ඒ අධිකරණය වෙත ගෙවනු ලබන්නාවූ දඩ මුදල් අතුරෙන් යම් ලිඛිත නීතියක් ප්‍රකාර ඒ දඩ මුදල්වලින් ගෙවිය යුතු යයි අධිකරණය විසින් කරනු ලබන යම් විධානයකට යටත්ව ඒ සියලු දඩ මුදල් පළාත් අරමුදලට බැර කරනු ලැබිය යුතුය.

අධිකරණ දඩ සහ ගාස්තු

(2) පළාත තුළ අධිකරණ බලය ක්‍රියාත්මක කරන යම් අධිකරණයක් විසින් එකතු කරනු ලබන සියලු අධිකරණ ගාස්තු ඒ පළාතේ පළාත් අරමුදලට බැර කරනු ලැබිය යුතුය.'

23. ප්‍රධාන ප්‍රඥප්තියේ 103 වන වගන්තියේ නියම කළ යන වචනය සහ නියම කරනු ලැබූ යන වචන වෙනුවට පිළිවෙළින් නියම කළ යන වචන සහ නියම කරනු ලැබූ යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 103 වන වගන්තිය සංශෝධනය කිරීම

24. ප්‍රධාන ප්‍රඥප්තියේ 104 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු

ප්‍රධාන ප්‍රඥප්තියේ 104 වන වගන්තිය ඇතුළත්

ලබන අතර, ඒ වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියේ 104 අ වන වගන්තිය ලෙස බලපැවැත්විය යුතුය. කිරීම

104 අ (1) මේ වගන්තියේ මින් මතු 'අරමුදල' යනුවෙන් සඳහන් කරනු ලබන පළාත් ආදායම් දිරිගැන්වීමේ අරමුදල නම් අරමදුලක් පිහිටුවනු ලැබිය යුතුය. පළාත් දිරිගැන්වීමේ අරමුදල

(2) 1991 ජනවාරි 01 වන දිනෙන් ආරම්භ වන වර්ෂය වෙනුවෙන් පරිපූරක ප්‍රදානයක් වශයෙන් පළාත් සභාව වෙත ඉදිරිපත් කිරීමට සලස්වනු ලබන මුදල් ප්‍රමාණ සහ ඉන්පසු අරමුදලේ කාර්ය සඳහා පළාත් සභාව විසින් වාර්ෂිකව විසර්ජනය කරනු ලබන මුදල් ප්‍රමාණ අරමුදලට ගෙවනු ලැබිය යුතුය.

(3) (අ) අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන යම් යෝජනා ක්‍රමයකට අනුකූලව පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධරයන්ගේ සුභසාධනය සඳහා අවශ්‍ය වන සියලු මුදල්, සහ

(ආ) කොමසාරිස්වරයා විසින් පරිපාලනය කරනු ලබන යම් ප්‍රඥප්තියක් කාර්යක්ෂම ලෙස පරිපාලනය කරනු ලැබීම

සහතික කිරීම අරභයා අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබූ යෝජනා ක්‍රමයකට අනුකූලව පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ නිලධරයන්ට දිරිගැන්වීමේ දීමනා අරමුදලෙන් ගෙවනු ලැබිය යුතුය.

(4) කොමසාරිස්වරයා විසින් හෝ තත්කාර්යය සඳහා ඔහු විසින් විශේෂයෙන් බලය පවරනු ලැබූ පළාත් ආදායම් දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකු විසින් නියමිත කාර්ය පරිපාටියට අනුකූලව අරමුදල පරිපාලනය කරනු ලැබිය යුතුය.

25. ප්‍රධාන ප්‍රඥප්තියේ 106 වන වගන්තිය පහත් දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 106 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) 'මේ ප්‍රඥප්තියෙහි' යන වචන වෙනුවට 'මේ ප්‍රඥප්තියෙහි' යන වචන ආදේශ කිරීමෙන්,

(2) 'ඇලෙන මුද්දරය' යන්නෙහි අර්ථ නිරූපනයේ '67 (1) වන වගන්තිය' යන යෙදුම වෙනුවට '76 (1) වන වගන්තිය' යන යෙදුම ආදේශ කිරීමෙන්,

(3) 'තක්සේරුකරු' යන්නෙහි අර්ථ නිරූපනයෙහි 'ඒ පනතේ' යන වචන වෙනුවට 'මේ ප්‍රඥප්තියේ' යන වචන ආදේශ කිරීමෙන්,

(4) 'බලයලත් නියෝජිතයා' යන්නෙහි අර්ථ

නිරූපණයෙහි,

(i) (1) වන ඡේදයේ 'ප්‍රඥප්තියේ' යන වචනය වෙනුවට 'ප්‍රඥප්තියේ' යන වචනය ආදේශ කිරීමෙන්,

(ii) එහි (2) වන ඡේදය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්

(2) මේ ප්‍රඥප්තියේ කාර්ය සඳහා තමා විසින් දෙනු ලබන බලය පැවරීමේ ලිපියෙහි නිශ්චිතව සඳහන් කරනු සම්බන්දයෙන් තමා වෙනුවෙන් ක්‍රියා කිරීමට යම් තැනැත්තෙකු විසින් කලින් කළ ලිඛිතව බලය පවරනු ලැබුවාවූද සමාගම (විගණකවරුන් නියෝග යටතේ විගණකවරයකු වශයෙන් ලියාපදිංචි කර ඇති පුද්ගලයකු වන්නාවූ කොමසාරිස්වරයා විසින් අනුමත කරනු ලබූ තැනැත්තකු වන්නාවූ හෝ 1979 අංක 28 දරණ දේශීය ආදායම් පනතේ කාර්ය සහා එම පනත යටතේ ඒ සම්බන්ධයෙන් සාදා ඇති නියෝග යටතේ දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයා විසින් අනුමත කරනු ලැබුවාවූද යම් පුද්ගලයෙක් අදහස් වේ'

(5) 'අය කළ යුතු' යන්නෙහි අර්ථ නිරූපණයෙහි ලියා අත්සන්

කරන ලද සාධන පත්‍රයක් හෝ යන වචන වෙනුවට ලියා අත්සන් කරන ලද සාධන පත්‍රයක් හෝ යන වචන ආදේශ කිරීමෙන්,

(6) ‘මුද්‍රාංකනය’ යන්නෙහි අර්ථ නිරූපණයේ යම් තහඩු මුද්‍රණයක්

අකුරු ආයුධයක් හෝ උපකණයක් හෝ එහි කොටසක් ඇතුළත් වේ.’ යන වචන වෙනුවට

‘යම් තහඩුවක් ප්‍රතිරූපයක්, මෙවලමක් හෝ උපකරණයක් හෝ එහි කොටසක් ඇතුළත් වේ. යන වචන ආදේශ කිරීමෙන්

(7) ලේඛන යන්නෙහි අර්ථ නිරූපණයේ බැඳුම්කරයක හෝ ඇප

පත්‍රයක් යන වචනවල සිට ඒ ඡේදයේ අවසානය දක්වා වූ සියලු වචන ඉවත් කොට ඒ වෙනුවට බැඳුම්කරයක් හෝ ඇපකරයක් ඇතුළත් වේ. යන වචන ආදේශ කිරීමෙන්

(8) නිසි පරිදි මුද්දර ගසන ලද යන්නෙහි අර්ථ නිරූපණයේ

පිටසන් කිරීමේ සහතිකයක් හෝ ඒ සාධන පත්‍රයේ ඇති බවද යන වචන වෙනුවට පිටසන් කිරීමේ සහතිකයක් හෝ ඒ සාධන පත්‍රයේ ඇති බව හෝ මුද්දර ගාස්තු ගෙවූ බව දැක්වෙන සහතිකයක් ඒ සාධන පත්‍රයට අලවා ඇති බවද යන වචන ආදේශ කිරීමෙන්

(9) ‘සාධන පත්‍රය’ යන්නෙහි අර්ථ නිරූපණය වෙනුවට පහත

දැක්වෙන අර්ථනිරූපණය ආදේශ කිරීමෙන් සාධන පත්‍රය යන්නට පළාත තුළ යම් නිශ්චල දේපළක් පැවරීමට හෝ පළාත තුළදී කරනු ලබන යම් මෝටර් වාහනයක් පැවරීමට අදාළ සෑම ලේඛනයක්ම ඇතුළත් වේ.

(10) ‘තැනැත්තා’ යන්නෙහි අර්ථ නිරූපණයේ ‘පුද්ගල

මණ්ඩලයක්'

යන වචන වෙනුවට 'පුද්ගල මණ්ඩලයක්' හෝ යම් රජයේ දෙපාර්තමේන්තුවක්' යන වචන ආදේශ කිරීමෙන්,

(11) 'ඇටෝර්නි බලය' යන්නෙහි අර්ථ නිරූපණයේ 'තැනැත්තා

වෙනුවෙන්, ඒ තැනැත්තාගේ නාමයෙන්' යන වචන වෙනුවට තැනැත්තා වෙනුවෙන් සහ ඒ තැනැත්තාගේ නාමයෙන් යන වචන ආදේශ කිරීමෙන්

(12) 'කාර්තුව' යන්නෙහි අර්ථ නිරූපණයට ඉක්බිතිවම පහත

දැක්වෙන අලුත් අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන් -

'පැවරීම' යන්නෙන් විකිණීමක්, තෑගි දීමක් හෝ හුවමාරු කිරීමක් අදහස් වන අතර, මිය ගිය තැනැත්තෙකුගේ බූදලයේ යම් දේපළක් ඊට ප්‍රතිලාභී හිමිකම ඇති යම් තැනැත්තකු වෙත හෝ මියගිය තැනැත්තාගේ අන්තිම කැමති පත්‍රය යටතේ පත් කොට ඇති භාරකරුවකු වෙත එකී මියගිය තනැත්තාගේ බූදලයේ පොල්මඃකරුවකු නැතහොත් අත්මිනිස්ත්‍රාසිකරුවකු විසින් ප්‍රතිෂ්ඨාවකින් තොරව සමර්පනය කිරීම හෝ එවැනි භාරකරුවකු විසින් ප්‍රතිලාභියකු වෙත ප්‍රතිෂ්ඨාවකින් තොරව කරනු ලබන සමර්පනය කිරීමක් හෝ මියගිය භාරකරුවකුගේ පොල්මඃකරුවකු අද්මිනිත්‍රාසිකරුවකු හෝ භාරකරුවකු විසින් උත්තරජීවී භාරකරුවකු වෙත හෝ අලුත් භාරකරුවකු වෙත ප්‍රතිශ්ඨාවකින් තොරව කරන සමර්පනය කිරීමක් ඇතුළත් වන අතර, පොදුවේ දරණ යම් ඉඩමක් බෙදා වෙන්

කර ගැනීමේ ඔප්පුවක් හෝ පැවරීමක් සඳහා වූ ගිවිසුමක් ඊට ඇතුළත් නොවේ.

(13) භාරකරු යන්නෙහි අර්ථ නිරූපණයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන්

'වටිනාකම' යන්න

(අ) තෑගි කරන ලද නිශ්චල දේපළක් නොවන යම් දේපළක් සහ යම් දිනයක් සම්බන්ධයෙන් යෙදෙන විට තක්සේරුකරුගේ මතය අනුව එදිනට විවෘත වෙළෙඳ පොළේදී ඒ දේපොළ සඳහා ලැබිය හැකි මිල එයින් එදහස් වේ.

(ආ) ත්‍යාග දායකයා විසින් 1977 මාර්තු 31 වන දිනදී හෝ ඊට පෙර අත්කර ගන්නා ලදුව තෑගි කරනු ලැබුවාවූ යම් නිශ්චල දේපළක් සම්බන්ධයෙන් යෙදී ඇති විට,

(1) ඒ දේපළ 1977 මාර්තු 31 වන දිනදී විවෘත වෙළෙඳ පොළේ විකුණන ලද්දේ නම් තස්සේරුකරුගේ මතය අනුව ඒ දේපොළ සඳහා ලැබිය හැකිව තිබුණු මිලට 1977 මාර්තු 31 වන දිනෙන් පසු සහ ඒ දේපොළ එසේ තෑගි කළ සාධන පත්‍රයේ දිනයට පෙර ඒ දේපළට යම් වැඩිදියුණු කිරීමක් වෙනස් කිරීමක් හෝ එකතු කිරීමක් කරනු

ලැබුවේ නම් ඒ සඳහා ගිය වියදම එකතු කිරීමෙන් ලැබෙන මුදල හෝ

(11) ඒ දේපොළ තෑගි කරන්නට යෙදුනු සාධන පත්‍රයේ දිනයේදී විවෘත වෙළෙඳ පොළේදී ඒ දේපොළ විකුණන ලද්දේ නම් තක්සේරුකරුගේ මතයට අනුව ඒ දේපොළ සඳහා ලැබිය හැකිව තිබුණු මිල,

යන දෙකින් අඩු මුදල අදහස් වේ.

(ඇ) ත්‍යාග දායකයා විසින් 1977 මාර්තු 31 වන දිනෙන් පසුව අත්කර ගන්නා ලදුව තෑගි කරනු ලැබුවා වූ නිශ්චල දේපළක් සම්බන්ධයෙන් යෙදී ඇති විට

(1) ඒ දේපොළ ත්‍යාග දායකයා විසින් අත්කර ගන්නා ලද දිනයේදී විවෘත වෙළෙඳ පොළේදී ඒ දේපොළ විකුණන ලද නම් තක්සේරුකරුගේ මතය අනුව ඒ දේපොළ සඳහා ලබිය හකිය තිබුණු මිලට ඒ දේපොළ එකී ත්‍යාග දායකයා විසින් අත් කර ගැනීමෙන් පසු සහ ඒ දේපොළ සාධන පත්‍රයේ දිනයට පෙර ඒ දේපොළට කරන ලද යම් වැඩිදියුණු කිරීමක් වෙනස් කිරීමක් හෝ එකතු කිරීමක් වේ නම් ඒ සඳහා ගිය වියදම එකතු කිරීමෙන් ලැබෙන මුදල හෝ,

(11) ඒ දේපොළ තෑගි කරන්නට යෙදුණු සාධන පත්‍රයේ දිනයේදී

විවෘත වෙළෙඳ පොළේදී ඒ දේපොළ විකුණන ලද්දේ නම් තක්සේරුකරුගේ මතයට අනුව ඒ දේපොළ සඳහා ලැබිය හැකිව තිබුණු මිල,

යන දෙකින් අඩු මුදල අදහස් වේ.

26. මෙම ප්‍රඥප්තියේ 2, 4, 5, 6, 7, 9, 10, 11, 12, 13, 14, 15, 16, 17, 18, 19, 23, 24 සහ 25 යන වගන්ති මගින් ප්‍රධාන ප්‍රඥප්තියට කරනු ලබන සංශෝධන සියලු කාර්ය සඳහා ප්‍රධාන ප්‍රඥප්තිය ක්‍රියාත්මකවූ දින සිට බලපවත්නා ලෙස සැලකිය යුතුය.

අතීතයට බලපැවැත්වීම

27. මේ ප්‍රඥප්තියේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

අනනුකූලතාවක් ඇතිවූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව